# ලක්දිව මහා සංඝරත්නය වෙනුවෙන් පහසුකම් සැලසීමේ ප්‍රමුඛයන් වූ පරුමක අභිධාන ලද්දන්ගේ ආගමික මෙහෙවරෙහි සුවිශේෂත්වය

## (ක්‍රි. පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 1 වන සියවස දක්වා බ්‍රාහ්මී අභිලේඛන මූලාශ්‍රය ඇසුරින්)

ඉන්දික සෙනෙවිරත්න[1]

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස අතර කාල පරිච්ඡේදයේ ලාංකේය සමාජ ස්ථරායනයේ ඉහළින් වැජඹුණු පිරිසක් ලෙස පරුමකවරු හඳුනාගත හැකි ය. මහින්දාගමනයත් සමඟ ව්‍යාප්ත වූ ලක්දිව අක්ෂර කලාව නිසා සංඝාරාම පූජාවන්හි දී ලෙන් ලිපි ලියවීමේ ක්‍රමයක් ආරම්භ විය. පරුමක යන්න මෙවන් අභිලේඛන අතර සුලභව හමු වන අභිධානයකි. ඔවුහු තම පෞද්ගලික ධනයෙන් සංඝාරාම ඉදි කර පූජා කිරීම පිළිබඳ තොරතුරු අනුව තත්කාලීන සමාජයේ යම් බලයක් සහ ප්‍රමුඛත්වයක් සහිතව විසූ ජන කොට්ඨාසයක් බව පැහැදිලිය. පරුමකවරු එවක සමාජයේ ගෞරවනීය ස්ථානයක වැජඹුන ද, ඔවුන් පිළිබඳ ඉදිරිපත් කෙරෙන මතවාදයන්ගේ පොදු එකඟතාවයක් මෙතෙක් දක්නට නොමැත. පරුමකවරු රජ පැළැන්තියේ ඇත්තන් හා ආවාහ විවාහ සිදු කළ බවට අභිලේඛන සපයන තොරතුරු අනුව සමාජ ස්ථරායනයේ ඉහළින් සිටි බවත්, පෞද්ගලික ආරාම පූජාවන්හි නිරත වීමෙන් ආර්ථික වශයෙන් ස්ථාවර පිරිසක් බවත් හඳුනා ගැනුන ද ඉන් ඔබ්බට ගිය සවිස්තර වාර්තාකරණයක් නොමැති තරම්ය. මෙම පර්යේෂණ පත්‍රිකාවේ දී "පරුමක අභිධාන ලද්දන් විසින් ඉටු කරන ලද ආගමික මෙහෙවර සමකාලීන වෙනත් අභිධාන ලද්දන්ට සාපේක්ෂ ව ප්‍රමුඛත්වයට පත්වන්නේ ඇයි?" යන පර්යේෂණ ගැටලුව මූලික වශයෙන් හඳුනාගත හැකිය. සමකාලීන වංසකතා හෝ වෙනත් ප්‍රාථමික මූලාශ්‍රය මෙම පර්යේෂණ කාර්යයෙහි දී හමු නොවන අතර ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් ක්‍රි. පූ. 3 වන සියවසත් ක්‍රි. ව. පළමුවන සියවසත් අතර කාල පරිච්ඡේදයේ හමු වන බ්‍රාහ්මී ලෙන් ලිපි ආදිය භාවිතා කිරීමට සිදු වේ. ප්‍රධාන වශයෙන් පරුමක අභිධාන ලද්දන්ගේ ආගමික කර්තව්‍යයන් විදහා දක්වෙන ලෙන් ලිපි තොරතුරු අතින් ඉතා පොහොසත් නොවන බැවින් අදාළ කාල පරිච්ඡේදයේ ලියැවුණු ලෙන් ලිපි විශාල ප්‍රමාණයක් මෙම පර්යේෂණයේ දී විශ්ලේෂණය කිරීමට සිදු වේ. එමගින් සමකාලීනව පරුමක අභිධානය ලද්දන් සිව් දිග මහා සංඝරත්නය වෙනුවෙන් ඉටු කළ ආගමික මෙහෙවරෙහි සුවිශේෂත්වය පර්යේෂණ පත්‍රිකාව ඔස්සේ පෙළ ගැස්වීමට අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පද :** පරුමක, බ්‍රාහ්මී අභිලේඛන, අභිධානය, සමාජ ස්ථරායනය, ආගමික මෙහෙවර

1 BA. (Ruhuna), PG Dip (PGIAR), සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය,
Email : 3180843@gmail.com